සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province
2201

11 ශ්‍රේණිය　　අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018　　80 S I

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I**　　**කාලය පැය එකයි**

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ගණන යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.


01. දත්ත සහ තොරතුරු ඉතාම හොඳින් විස්තර කරනුයේ පහත කුමක් මගින් ද ?
    (1) තොරතුරු අමු කරුණු වන අතර දත්ත යනු සකසන ලද තොරතුරු වේ.
    (2) දත්ත සෑම දිනම එක්රැස් කරන අතර තොරතුරු මාසිකව එක් රැස් කරයි.
    (3) දත්ත අමු කරුණු වන අතර තොරතුරු යනු සකසන ලද දත්ත වේ.
    (4) දත්ත සහ තොරතුරු වලංගු වන්නේ සැකසීමකට භාජනය වුවහොත් පමණකි.

02. අනුකලිත පරිපථ මගින් රික්ත නල ප්‍රතිස්ථාපනය වීම නිසා ඇති වූ ප්‍රතිඵලයක් වන්නේ පහත කුමක් ද?
    (1) සැකසීමේ බලයසහ විදුලිබල පරිභෝජනය ඉහළ යාම
    (2) සැකසීමේ බලය ඉහළ යාම සහවිදුලිබල පරිභෝජනයපහළයාම
    (3) සැකසීමේ බලයසහවිදුලිබල පරිභෝජනය පහළයාම
    (4) සැකසීමේ බලය පහළයාමසහවිදුලිබල පරිභෝජනයඉහළ යාම

03. ලේසර් මුද්‍රන යන්ත්‍ර සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ පහත කුමක්ද ?
    (1) ඉහළ ගුණාත්මක තත්වයෙන් යුත් පාඨ සහ රූප වේගයෙන් ලබාදේ.
    (2) තිත් න්‍යාස මුද්‍රන යන්ත්‍රයකට සාපේක්ෂව මිලෙන් අධිකය.
    (3) නඩත්තු කිරීම ලාභ දායකය.
    (4) පිටුවක් මුද්‍රණයට වැය වන මුදල තීන්ත විදුම් මුද්‍රන යන්ත්‍රයකට වඩා අඩු ය.

04. පරිගණක සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ පහත කුමක් ද?
    A. Gottfried Leibnitz පැස්කලයින් නිපද වූයේ ය.
    B. ක්ෂුද්‍ර සකසනවල රික්ත නල භාවිතා වේ.
    C. ට්‍රාන්සිස්ටර පරිපථවලට වඩා අඩු බලයක් ICභාවිතා කරයි
    D. විශ්ලේෂක එන්ජිම (Analytical engine) සිද්ධාන්ත පද්ධතිය මත පදනම් විය.
    (1) A, B සහ Cපමණකි.　(2) B,C සහ Dපමණකි.　(3) A, B සහ Dපමණකි.　(4) A, C සහ Dපමණකි.


05. 1 රූපයේ දක්වා ඇති ජාල ස්ථල විද්‍යාව වන්නේ
    (1) බසයක් ආකාරයේ　(2) මුදුවක් ආකාරයේ
    (3) තරු ආකාරයේ　(4) ස්විචයක් ආකාරයේ



1 රූපය

06. තරු ආකාරයේජාල ස්ථල විද්‍යාවක වාසියක් නොවන්නේ පහත කුමක් ද?
    (1) ජාලය කළමනාකරණය පහසුවීම
    (2) වැඩි කේබල ප්‍රමාණයක් අවශ්‍ය වීම
    (3) පුළුල් කිරීමට වැඩි අවස්ථාවක් ලබා දීම　(4) අනෙක් ආකාර වලට වඩා ජනප්‍රිය වීම

07. 2 රූපය නිවැරදි ලෙස ලේබලකර දක්වා ඇත්තේ පහත කුමක ද?
    (1) A-අභ්‍යන්තර සන්නායකය, B- ආවරණය, C- ප්ලාස්ටික් කවරය, D-පරිවාරකය
    (2) A-පරිවාරකය, B-ප්ලාස්ටික් කවරය, C-ආවරණය, D-අභ්‍යන්තර සන්නායකය
    (3) A-ප්ලාස්ටික් කවරය, B-පරිවාරකය, C- අභ්‍යන්තර සන්නායකය, D-ආවරණය
    (4) A-ආවරණය, B- අභ්‍යන්තර සන්නායකය, C-පරිවාරකය, D-ප්ලාස්ටික් කවරය





2 රූපය

08. තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලයේ සැරිසැරීම ...................... අයත් වේ.
    (1) අර්ධ-ඒකපථ　(2) පූර්ණ -ද්විපථ　(3) අර්ධ-ද්විපථ　(4) ඒකපථ

09. පහත කුමක් ඇලවීම විධානය සඳහා වන කෙටි මං යතුර වේ ද?
    (1) Ctrl+P　(2) Ctrl+A　(3) Ctrl+X　(4) Ctrl+V

10. අධිසන්ධානයක් ඇතුලු කිරීමට යොදාගත යුතු මෙනුව පහත කුමක් වේ ද?
(1) Insert (2) Design (3) page layout (4) home

- **ප්‍රශ්න අංක 11 සිට 13 දක්වා පහත රූපය 3 භාවිතා කර පිළිතුරු සපයන්න.**



3 රූපය

11. P සහ Q ලේබල මගින් පහත කුමක් පිළිවෙලින්දක්වයි ද?
(1) sansserif, subserif
(2) subscript ,superscript
(3) subserif, sansserif
(4) superscript, subscript

12. R ලේබලය මගින් ..................මෙවලම දක්වයි.
(1) අකුරු ප්‍රමාණය අඩු කිරීම
(2) Change Case
(3) අකුරු ප්‍රමාණය වැඩි කිරීම (4) සියල්ල ඉවත් කිරීම

13. අක්ෂර සඳහා පාට යෙදීමට භාවිතා කරන මෙවලම පහත කුමන ලේබලයද?
(1) S (2) T (3) W (4) Y

- **ප්‍රශ්න අංක 14 සිට 16දක්වා පහත වගුව භාවිතා කර පිළිතුරු සපයන්න.**

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | Swimmer | Freestyle | Backstroke | Butterfly | Total |
| 2 | Blue | 5 | 4 | 4 | 13 |
| 3 | Red | 4 | 5 | 3 | 12 |
| 4 | Geen | 2 | 2 | 5 | 9 |
| 5 | Yellow | 3 | 4 | 2 | 9 |

14. ශිෂ්‍යයෙක් Red පිහිණුම් කණ්ඩායමේ මුළු ලකුණු ගණනය කිරීමට = SUM (B3:D3) යන සමීකරණය භාවිතා කරයි. එම සමීකරණය ඇතුළු කළ යුතු කෝෂය වන්නේ .............
(1) E2 (2) E3 (3) E4 (4) E5


15. ඉහත ඇතුළු කරන ලද සමීකරණය ඊට කෝෂ දෙකකට පහත කෝෂයට පිටපත් කළේ නම් E5 කෝෂයේ දිස්වන සමීකරණය වන්නේ?
(1) = SUM (B2:D5) (2) = SUM(E2:E5) (3) = SUM (B2:D2) (4) =SUM (B5:D5)

16. Green පිහිණුම් කණ්ඩායමේ සාමාන්‍ය ලකුණු ගණනය කිරීමට යොදා ගත හැකි සමීකරණය පහත කුමක් ද?
(1) = AVG (B4:D4) (2) = Total(B4:D4)/3 (3) = AVERAGE (B4:D4) (4) = AVERAGESUM (B4:D4)

17. අන්තර්ජාලය සම්බන්ධ පහත වගන්ති සලකන්න.
A. අන්තර්ජාලයයනු විශ්විය ජාලයන්ගේ ජාලයකි.
B. අන්තර්ජාලයේ හිමිකාරීත්වය W3Cට අයත් ය
C. උඩුගත කිරීමේ නියමාවලිය (FTP) මගින් පමණක් හුවමාරු කරන ලද තොරතුරු බාගත කළ හැක.
ඉහත කුමන ප්‍රකාශ නිවැරදි ද?
(1) A සහ Bපමණකි. (2) B සහ Cපමණකි. (3) A, සහ Cපමණකි. (4) A, B සහ Cපමණකි.

18. වෙබ් අඩවියක් උඩුගත කිරීමට අත්‍යවශ්‍ය නොවන්නේ පහත කුමක් ද?
(1) IP ලිපින (2) වෙබ්සේවාදායකය (3) වෙබ් අතිරික්සුව (4) වෙබ්සන්ධාරය

19. පහත වෙබ් පිටු බන්ධය ඩයිනොසරයන් සම්බන්ධව වේ.
අධිසන්ධානයක් වීමට වඩාත්ම ඉඩකඩ ඇති අංකය
වන්නේ කුමක් ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4




20. පහත කුමක් HTML සම්බන්ධව සත්‍ය වන්නේ ද?
(1) එය පරිගණක ක්‍රමලේඛ භාෂාවකි.
(2) එය අක්ෂර බේදය හඳුනයි.
(3) භාවිතා කරනුයේ පරිශීලක අර්ථ දැක්වූ උසුලන පමණකි.
(4) පූර්වයෙන් අර්ථ දැක්වූ උසුලන භාවිතා කරයි.

- <u>පහත වගුව භාවිතා කර ප්‍රශ්න අංක 21 සිට24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.</u>

සුවසහන සෞඛ්‍ය සංගමයට තම සාමාජිකයන්ගේ පෞද්ගලික තොරතුරු ගබඩා කර ගැනීමට අවශ්‍යව ඇත.එම විස්තර පහත වගුවේ දක්වා ඇත.

| Mem_No | Name | Tel_Num | Join_date | Mem_type |
|---|---|---|---|---|
| 20201 | Saman | 011 234564 | 12/04/2013 | E |
| 20002 | Gemunu | 081 123444 | 23/05/2013 | E |
| 20003 | Palitha | 034 567890 | 15/03/2014 | W |
| 20006 | Kamal | 136 234444 | 01/01/2014 | W |


21. පහත ඒවා අතරින් එම විස්තර ගබඩා කිරීමට වඩාත්ම සුදුසු ආකාරය කුමක් ද?
(1) දත්ත සමුදාවගුව (2) වදන් සැකසුමක් ආධාරයෙන් සැකසූ වගුව
(3) පැතුරුම් පත් වගුව (4) HTML වගුව

22. ඉහත වගුවේ ක්ෂේත්‍ර සහ රෙකෝඩ සංඛ්‍යා වන්නේ?
(1) ගොණු 5, රෙකෝඩ4 (2) ක්ෂේත්‍ර5, රෙකෝඩ4 (3) ක්ෂේත්‍ර5,රෙකෝඩ 5 (4) ගොණු 4 ,රෙකෝඩ5

23. Tel_Num ක්ෂේත්‍රයේ දත්ත ප්‍රරූපය සඳහා වඩාත් සුදුසු වන්නේ පහත කුමක් ද?
(1) Text (2) Number (3) Logical (4) Date/Time

24. Mem_type "E" ට අයත්වන සියලු පුද්ගලයන් සොයා ගැනීමට යොදා ගත හැකි කොන්දේසිය වන්නේ පහත කුමක් ද?
(1) Mem_type< "E" (2) Mem_type <> "E" (3) Mem_type> "E" (4) Mem_type= "E

25. සමර්පණ මෘදුකාංගයක ඇති සමර්පණ දසුන් 4 රූපයේ දක්වා ඇත.
පහත කුමක් එහි නිවැරදි ලේබල කිරීම දක්වයි ද?
(1) A- කියවුම්, B- Notes page,C- සාමාන්‍ය, D- Outline, E- කදා සුබෙදුම්
(2) A-සාමාන්‍ය,B-Outline, C-කදා සුබෙදුම්, D-Notes page, E-කියවුම්
(3) A- Outline,B- සාමාන්‍ය, C- කියවුම්, D-Notes page, E- කදා සුබෙදුම්
(4) A- Notes page,B-කියවුම්, C- Outline, D-කදා සුබෙදුම්, E-සාමාන්‍ය



4 රූපය

26. පහත වගුවේ සඳහන් මෙවලම් අංකයට නිවැරදිව ගැලපෙන කාර්යය ලේබලය තෝරන්න.
(1) ❶-A ❷-B ❸-C ❹-D
(2) ❶-B ❷-C ❸-D ❹-A
(3) ❶-C ❷-A ❸-B ❹-D
(4) ❶-D ❷-C ❸-A❹-B

| | |
|---|---|
| ❶  | A. තෝරාගත් කොටස චලනය |
| ❷  | B. අවශ්‍ය කොටස අවශ්‍ය හැඩයෙන් තෝරා ගැනීම |
| ❸  | C. තෝරාගත් කොටසකට වර්ණයක් හෝ මෝස්තරයක් යෙදීම. |
| ❹  | D. ස්ථර හෝ වස්තූන් එකෙල්ල කිරීම |

27. bpp අගය 6 වන රූපයක පික්සලයක අඩංගු වර්ණ සංඛ්‍යාව පහත කුමක් නිරූපණය කරයි ද?
(1) 32 (2) 64 (3) 128 (4) 16

28. පහත වගුවේ සඳහන් අංකයට නිවැරදිව ගැලපෙන කාර්යය ලේබලය තෝරන්න.
(1) ❶-A ❷-B ❸-C ❹-D
(2) ❶-B ❷-C ❸-D ❹-A
(3) ❶-C ❷-D❸-A❹-B
(4) ❶-D ❷-C ❸-A❹-B

| | |
|---|---|
| ❶ කාල රාමුව | A. චලනයක් ආරම්භයේදී සහ අවසානයේදී හමුවේ. |
| ❷ තත්ව කවුළුව | B. මූලික රාමු දෙකක් අවශ්‍ය වේ |
| ❸ මූලික රාමුව | C. සජීවීකරණයක කාල වකවානුව සකස් කරයි |
| ❹ ට්වීන් | D. වස්තුවක තත්ව වෙනස් කිරීමට යොදා ගනී |

- <u>පහත කේතය භාවිතා කර ප්‍රශ්න අංක 29 සිට 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.</u>

29. පහත කේතයේ ප්‍රතිදානය කුමක් ද?

```
x =0
y=1
while x  <> 4
      x = x +1*y
      y=y+1
Print ("x is", x)
```

(1) x is 1 (2) x is 2 (3) x is 3 (4) x is 4

30. y හි අගය වන්නේ කුමක් ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4

31. මෙම කේත ඛණ්ඩය .................. පාලන ව්‍යුහය භාවිතා කරයි.
(1) වරණය (2) පුනර්කරණය අනුක්‍රමය (4) while

32. පද්ධති පරීක්ෂා ක්‍රමයක් නොවන්නේ පහත කුමක් ද?
(1) පද්ධති (2) මෘදුකාංග (3) ඒකක (4) සමස්ත

33. SDLC ආකෘති සම්බන්ධව සත්‍ය වන්නේ පහත කුමක් ද?
(1) දියඇළි ආකෘතිය චක්‍රීය ක්‍රමයකි. (2) දියඇළි ආකෘතිය එක් වරකට එක් අවධියක් අවසන් කරයි.
(3) පුනර්කරණ වෘද්ධි ආකෘතිය රේඛීය වේ (4) මූලාදර්ශ ආකෘතිය ඉතාම සුදුසු ක්‍රමය වේ.

34. වෙබ් සංස්කරණ මෘදුකාංග සම්බන්ධව සත්‍ය වන්නේ පහත කුමක් ද?
(1) FrontPage සහ Kompozer විවෘත ප්‍රභව වෙබ් සංස්කරණ මෘදුකාංගවේ.
(2) සියලු වෙබ් සංස්කරණ මෘදුකාංගවිවෘත ප්‍රභව වේ.
(3) HTML ලේඛන ස්වයංක්‍රීයව සෑදීමට උදව් දේ
(4) Ckeditor යනු වෙබ් සංස්කරණ මෘදුකාංගයකි.

35. සේවාස්ථානයන්හි මිනිසුන් වෙනුවට රොබෝවරුන් භාවිතයේ වාසිය/වාසි වන්නේ පහත කුමක් ද?
විඩාවට පත් නොවේ. නව තත්වයන්ට ප්‍රතිචාර දැක්විය හැක.
වැරදීම් සිදු නොවේ. කාර්යයන් ඉතා ඉක්මණින් සිදු කළ හැක.
(1) A, B සහ C පමණකි. (2) B, C සහ D පමණකි. (3) A, B සහ D පමණකි. (4) A, C සහ D පමණකි.

36. පරිගණක පද්ධතියකට හානිකර මෘදුකාංගයක් ස්ථාපනය සිදු නොවන ආකාරයක් වන්නේ පහත කුමක් ද?
(1) නීති විරෝධී මෘදුකාංග ස්ථාපනය.
(2) වෙබ් අඩවි වලට ගොස් අනාරක්ෂිත දිගු ක්ලික් කිරීම
(3) අනවසරයෙන් ඇතුළු වී මෘදුකාංග ස්ථාපනය.
(4) වෛරස් ආරක්ෂක මෘදුකාංගය නිරතුරුව යාවත්කාලීන කිරීම

37. තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපරාධ පිළිබඳ පහත වගන්ති සලකන්න.
A. සමාජ මාධ්‍ය භාවිතය
B. අනවසරයෙන් තවෙකෙකුගේ රූප උඩුගත කිරීම.
C. පුද්ගල ප්‍රතිරූපයට හානිවන ආකාරයේ තොරතුරු පළ කිරීම
D. තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අපරාධලෙස ගැනෙන්නේ ඉහත කුමක් ද?
(1) A සහ B පමණකි. (2) B සහ C පමණකි. (3) A සහ C පමණකි. (4) A, B සහ C පමණකි.

38. පහත කුමන වගන්තිය සාවද්‍ය ද?
(1) ප්‍රතිභාගීකරණය මගින් ගොනුවේ කොටස් ආවයන උපක්‍රමයේ පිළිවෙලින් සකසයි.
(2) ආකෘතිකරණය මගින් දෘඩ තැටියක් දත්ත ආවයනයට සුදුසු ආකාරයට පත් කරවයි.
(3) එක් දෘඩ තැටියක් තාර්කිකව කොටස් කිහිපයකට බෙදා වෙන් කිරීම පංගු කිරීම නම් වේ.
(4) ඛණ්ඩනය මගින් ගොනු කිහිපයක් කොටස්වලට බෙදීම සහ විවිධ ස්ථානවල ආවයනය සිදුවේ.

39. මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව වන පහත වගන්ති සලකන්න.
A. එය මෘදුකාංගසහ පරිගණක දෘඩාංග අතර අතුරු මුහුණතක් ලෙස ක්‍රියාකරයි.
B. සම්පත් සපයාදීම සහ මුදා හැරීම සිදු කරයි.
C. ප්‍රාථමික මතකය පිළිබඳව අවධානය යොමුකරයි.
ඉහත කුමක් මෙහෙයුම් පද්ධතියක් සමඟ සම්බන්ධ වන්නේ ද?
(1) A සහ Bපමණකි. (2) B සහ Cපමණකි. (3) A, සහ Cපමණකි (4) A, B සහ Cපමණකි.

40. ICT හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලුවක් නොවන්නේ පහත කුමක් ද?
(1) CVS (2) CTS (3) RSI (4) RGB

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved


මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம் 2201
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 80 S II |
|---|---|---|

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II — කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයට ලකුණු 20 සහ අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු දහය බැගින් හිමි වේ.

01. (i) පහත පරිපථයේ Q ප්‍රතිදානයට අදාල බූලියානු ප්‍රකාශනය ලියා දක්වන්න.




(ii) පහත පද සඳහා වඩාත්ම ගැලපෙන විස්තරය තෝරන්න. ලේබලයට ඉදිරියෙන් අදාල අංකය ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

| | පදය | | විස්තරය |
|---|---|---|---|
| a) | නිබලය | i. | 1 PB |
| b) | RJ 45 | ii. | මූසිකය |
| c) | VGA | iii. | බයිටකින් අඩකි |
| d) | PS/2 | iv. | මුද්‍රණ යන්ත්‍රය |
| e) | 1024 TB | v. | මාර්ගකාරකය සම්බන්ධ කරයි |
| | | vi. | සිදුරු 15 |

(iii) හබ් එකක් සහ ස්විචයක් අතර ඇති ප්‍රධාන වෙනස පැහැදිලි කරන්න.

(iv) $2047_8$ අනුරූප ෂඩ් දශමය අගයට පරිවර්තනය කරන්න.

(v) උපයෝගිතා මෘදුකාංගයක කාර්ය දෙකක් නම් කරන්න.

(vi) ආරෝග්‍යශාලාවක් ඉලෙක්ට්‍රොනික දත්ත පාදකයක් භාවිතා කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න

(vii) ජගත් හට මිතුරෙක්ගෙන් $2X\ 2^{20}$ MB සහ 4 GB ධාරිතා සහිත ආචයන උපක්‍රම දෙකක් ලැබිණ. මෙම ධාරිතා අතරින් විශාල ධාරිතාවය කුමක් ද?එය සෙවීමට ඔබ අනුගමනය කරන පියවර පැහැදිලිව දක්වන්න.

(viii) ශ්‍රමක්ෂමතා විද්‍යාව යනු පරිශීලකයාට ඇතිවන අනතුරු,අපහසුතා සහ වෙහෙස අඩු කරන උපකරණ නිර්මාණය කිරීමේ විද්‍යාවයි.මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව පැහැදිලි කරන්න.

(ix) පරිගණක ක්‍රමලේඛනයේදී පරිවර්තක වල අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(x) b=3 සහ a=8 වන විට පහත පැස්කල් කේත ඛණ්ඩයේ ප්‍රතිදානය ලියන්න.

```
Program testing;
vara,b,x:integer;
begin
   while b>=3 do
   begin
     write('Input an integer: ');
     readln(a);
     x:=x MOD 2;
     if(x==0) then
     writeln(a+1,'is an odd number.');
     b=b-1;
    end;
end.
```

02. නොවැම්බර් මාසය සඳහාසියළුම සේවකයන්ට ප්‍රසාද දීමනාවක් ලබා දීමට සමාගම අදහස් කරයි. එම ප්‍රසාද දීමනා ප්‍රතිශතය E2 කෝෂයේ නිරූපණය වේ.

| | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | 5 | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | August | September | October | November |
| 5 | No | Name | Department | Town | Salary (Rs.) | Salary (Rs.) | Salary (Rs.) | Salary (Rs.) |
| 6 | 1 | Lal | Sales | Kandy | 20,000.00 | 20,000.00 | 20,000.00 | |
| 7 | 2 | Kamal | HR | Colombo | 55,000.00 | 50,000.00 | 55,000.00 | |
| 8 | 3 | Sanath | Sales | Hatton | 20,000.00 | 20,000.00 | 20,000.00 | |
| 9 | 4 | Mahesh | Marketing | Kandy | 25,000.00 | 25,000.00 | 25,000.00 | |
| 10 | 5 | Arun | Sales | Colombo | 15,000.00 | 15,000.00 | 18,000.00 | |
| 11 | 6 | Ravi | HR | Hatton | 20,000.00 | 20,000.00 | 22,000.00 | |
| 12 | 7 | Riyaz | Marketing | Matale | 25,000.00 | 25,000.00 | 20,000.00 | |
| 13 | | | | | | | | |
| 14 | | | | | | | | |

(i) නොවැම්බර් මාසය සඳහා ලාල්ට හිමි වැටුපගණනය කිරීම සඳහා I6කෝෂයේ ඔබ සඳහන් කරන සමීකරණය ලියන්න.ප්‍රසාද දීමනාව ගණනය කරනුයේ අගෝස්තුමස වැටුප පදනම් කරගෙන බව සලකන්න.

(ii) ඉහත ඔබ සඳහන් කළ සමීකරණයනොවැම්බර් මාසය සඳහා අනෙක් සේවකයන්ට හිමි වැටුප ගණනය කිරීම සඳහාපිටපත් කළහොත්, I11 කෝෂයේ නිරූපණය වන සමීකරණය ලියන්න.

(iii) වැටුප් ලබාදෙන දිනයට පෙර ඉහත ප්‍රසාද දීමනාව 2% දක්වා වෙනස් කිරීමට සමාගම අදහස් කරයි. එම වෙනස්කම සිදු කළ විට වෙනස්වන කෝෂය/කෝෂ පරාසය සඳහන් කරන්න.

(iv) අගෝස්තු සහ නොවැම්බර් මාසයන්හි වේතන අතර වෙනස නිරූපණය වන ප්‍රස්ථාරයක් 1 රූපයට ඇතුල් කිරීමට සමාගමට අවශ්‍යව ඇත. ඒ සඳහා ඉතාම සුදුසු ප්‍රස්ථාර වර්ග දෙකක් නම් කරන්න.

03. මෝටර් රථ කුලියට සපයන ආයතනයක් එහි තොරතුරු ගබඩා කිරීමටදත්ත පාදකයක් සෑදීමට අදහස් කරයි.එහි මෝටර් රථ සහ රියදුරන් පිළිබඳ විස්තර අඩංගු වේ.මෝටර් රථයක් ඕනෑම රියදුරෙක්ට ධාවනය කළ හැක. එක් රියදුරෙක්ට මෝටර් රථ එකක් හෝ කිහිපයක් ධාවනය කළ හැක.

Car වගුව

| V_ID | Tittle |
|---|---|
| V031 | Mini Audi |
| V425 | Alto |
| V274 | Nissan |

driver වගුවcar driver වගුව

| dri_ID | Name |
|---|---|
| 001 | Mathew |
| 002 | Indu |
| 003 | Saliya |

| dri_ID | V_ID | Date |
|---|---|---|
| 001 | V031 | 03/23/2017 |
| 002 | V425 | 10/02/2018 |
| 003 | V425 | 05/05/2017 |

(i) ඉහත විස්තරයට අනුව මෝටර් රථය සහ රියදුරා අතර ඇති සම්බන්ධතාව හඳුන්වන්න.

(ii) ඉහත දත්ත සමුදායේ ප්‍රාථමික යතුරු දෙකක් ඒවායේ වගුවල නම් සමඟ සඳහන් කරන්න.

(iii) 12/06/2018 දින මැතිව් Alto රථය ධාවනය කරන ලදී.
1. යාවත්කාලීන වූ වගුවේ/වගුවල නම/නම් සඳහන් කරන්න.
2. යාවත්කාලීන වූ වගුවේ/වගුවල රෙකෝඩ් ලියා දක්වන්න.

(iv) නව රියදුරෙක් වන ගාමිණී 02/06/2018 දින MiniAudioරථය ධාවනය කරන ලදී.
1. යාවත්කාලීන වූ වගුවේ/වගුවල නම/නම් සඳහන් කරන්න
2. යාවත්කාලීන වූ වගුවේ/වගුවල රෙකෝඩ් ලියා දක්වන්න.

04. (a) වරහන් තුළ ඇති වචන යොදාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.


විශ්ව විසිරි වියමන යනු ------❶------ මගින් සපයනු ලබන ----❷--------කි. එය සමන්විත වන්නේ ඉතා විශාල ----❸-------- ලේඛන එකතුවකිනි. පරිශීලකයෙකුට එම එකතුවට ප්‍රවේශවීම සඳහා ------❺----- මෘදුකාංගයන්ට අයත් වන -----❹------- භාවිතා කළ හැක.

(යෙදුම්, ඉලෙක්ට්‍රොනික, නියමාවලිය,සේවාව, DNS, උපයෝගිතා,වෙබ්අතිරික්සුව, URL, පද්ධතිය, අන්තර්ජාලය)

(b) දත්ත සොරාගැනීම යනු කුමක්දැයි සුදුසු නිදසුනක් භාවිතා කර පැහැදිලි කරන්න.

(c) තාර්කික ආරක්ෂාව පවත්වා ගැනීමට භාවිතා කරන ක්‍රම තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (a) 2 වන රූපයේ ඇති වෙබ් පිටු ඛණ්ඩය සාදා ඇත්තේ 3 රූපය ලෙස නම් කර ඇති ප්‍රභව කේතය භාවිතා කරමිනි.




2 රූපයෙහි ❶ සිට ❿ දක්වා ලේබල කරන ලද හිස්තැන් දහයක් වේ. පහත සපයා ඇති ලැයිස්තුවෙන් ඒවා සඳහා ඉතාම සුදුසු HTML උසුලන හෝ ලේබල තෝරන්න.
(img, table, ol, title, h2, href, p, alt, a, br,tr, ul, center,rowspan ,li)
නිදසුන: ❶ සඳහා ගැලපෙන්නේ b නම් ❶ = b ලෙස පිළිතුරු සපයන්න.

```
<html><head><❶>Wildlife Safaries</❶></head>

<body><❷>Most Thrilling Wildlife Safaries in Sri Lanka</❷><❸><❹><td ❺
=2><❻src="wl1.jpg" alt=deer width=200 height=200></td><td>One of the
many reasons as to why people visit Sri Lanka is because of its very diverse
wildlife. From flora to fauna, a lot of species are only endemic to Sri Lanka. A
lot of people, even the locals come to nature reserves and forests to get a
glimpse of rare creatures for maybe once in their whole lifetime. A lot of
nature reserves and santuaries are in Sri Lanka in order to protect the
wildlife from human interests that might harm the animals including
poaching.<❼> Visitors are allowed in to these reserves where you can take
safari trips(A trained guide is provided by the reserves)
</❼></td></❹><❹><td><❽><li>Yala National Park</li><li>Wasgamuwa
National Park</li><li>Wilpattu National Park</li><li>Udawalawe National
Park</li><li>Bundala National Park</li><li>Gal Oya National Park </li> <li>
Horton Plains </li> <li> Kaudulla Nature Reserve </li> </❽> </td> </❹>
</❸> <❾❿=more.html>read more<a></body></html>
```

06. පාසල් සමූපකාරයක කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා තොරතුරු පද්ධතියක් සෑදීමට අදහස් කරයි.මේ දිනවල එම තොරතුරු පද්ධතියක් සෑදීමේ නිරත වන පුද්ගලයා පාසල් සමූපකාරය වෙත පැමිණෙන සිසු සිසුවියන් වෙත ප්‍රශ්ණ සහිත පත්‍රිකාවක් ලබා දෙයි.

(a) පාසල්සමූපකාරයේ සිටින ඉහත පුද්ගලයාගේ වෘත්තිය කුමක් විය හැකි ද?

(b) ඔහු පාසල්සමූපකාරයේ සිදු කරනුයේ කුමක් ද ?


(c) තොරතුරු පද්ධතිය අයත් වන SDLC අවධිය කුමක් ද?

(d) ඉහත c) කොටස සඳහා ඔබ ලබා දුන් පිළිතුර හේතුවක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

(e) තොරතුරු පද්ධතියේ මීළඟ අවධියේ දී සිදු කරන ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(f) තොරතුරු පද්ධතියේ අවසන් අවධියේ දී සිදු කරන ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

07. (a) පහත ගැලීම් සටහන පුද්ගලයින් තිස් දෙනෙකුගේ වැටුප් ගණනය කරයි.සෑම පුද්ගලයෙක්ගේම මූලික වැටුපෙන් 25% ක් ගෙවල් කුලිය(house rental) සඳහාද, 15% ක් වෛද්‍ය ප්‍රතිකාර (medical allowance), 2 % ක් නිල ඇඳුම් පවත්වා ගැනීම (uniform maintenance) සඳහා දීමනා ලෙස ලබාදේ. මුළු වැටුප ගණනය කරනුයේ මූලික වැටුපට ගෙවල් කුලී දීමනාව,වෛද්‍ය ප්‍රතිකාරදීමනාව සහ නිල ඇඳුම් පවත්වා ගැනීමේදී මනාවඑකතු කිරීමෙනි. මෙමගින් එක් එක් පුද්ගලයාගේ වැටුප මුද්‍රනය කරයි. ගැලීම් සටහන හොඳින් පරීක්ෂා කර A සිට Iදක්වා ඇති ලේබල සම්පූර්න කරන්න.




(b) රු. 10000 ට වඩා වැඩි වැටුපක් ලබාගන්නා සේවකයන් සංඛ්‍යාව ගණනය කළ යුතු යැයි සිතන්න.

(i) ඒ සඳහා ඔබ යෝජනා කරන ව්‍යාජ කේත ඛන්ඩය ලියන්න.

(ii) එම ව්‍යාජ කේත ඛන්ඩයේ ප්‍රකාශවලට අදාල ගැලීම් සටහන් සංකේතඉහත ගැලීම් සටහනට ඇතුලත් කිරීම ඔබට පැවරී ඇත.

උදා.:-**A** සහ **B** අතර